# දහම් වටිගුව

## රොනීත් ගිය පසු

මේ ලෝකය සුන්දර තැනක් කරන්නටම කැපවුණ මිනිසුන් ගැහැනුන් පිළිබඳව අප්‍රමාණ ආදරයක් චූටි මල්ලිගෙ හිතේ තියෙනවා. අපේ නීරස ජීවිත රසයෙන් පුරවන මේ අය වරින් වර අප හැර යද්දි හිතට දැනෙන වේදනාව නම් වචන වලින් ලියන්න බැහැ බ්‍රෝ..

මං මේ ලියාගෙන ආවෙ අපේ ජනප්‍රිය ගායක රොනී ලීච් අප හැර ගොහින්ය කියන ආරංචියෙන් ඇතිවුණ කම්පනය. අපේ ප්‍රබුද්ධ අයට අරහං වුණත් රොනී ලීච් කියන්නෙ මිනිස්සුන්ගෙ හිත් වලට රසයක් එක්කකළ අපූරුම ගායන ශිල්පියෙක්. කොටින්ම ඔහු හොඳ එන්ටටේනර් කෙනෙක්. සිංහලයෙක් නොවුණත් සිංහලෙන් ගී ගයා අප පිනවූ රසවතෙක්. ඔහු නිසා රසවත් වුණ ලක්ෂ ගණනාවක් වෙච්ච රසිකයන් වෙනුවෙන් චූටි මල්ලිගෙ කණගාටුව ලියා තියන්න කැමතියි.

කලාව වර්ග කරගෙන බෝඩ් ලෑලි ගහගන්නවට චූටි මල්ලි කවදත් කැමති නැහැ. අපි ඩීමන් ආනන්දගෙ ඉඳන් ලියෝ ටොල්ස්ටෝයි නැත්නම් මැක්සිම් ගෝර්කි දක්වා මහා පරාසයක පොත් කියවපු අය. ඒ වගේම අපි අමරදේව මහත්තයගේ ඉඳන් රොනි ලීච් මහත්තයා දක්වා මහා පරාසයක ගී රස වින්ද අය. මේ පරාසය ඇතුලෙ තියෙන ඕනෙම ගීයක් රස විඳින්න අපට පුලුවන් වීමම විසාල සතුටක් චූටි මල්ලි ඒකට කියන්නෙ වර්ග කිරීමකින් තොරව රස විඳීම කියලා. බොරුවට ප්‍රබුද්ධයෙක් කියලා බෝඩ් ලෑල්ලක් ගහගෙන පොරක් වගේ පෙනී ඉඳීමේ ආසාවක් චූටි මල්ලිට නැහැ.

ඉතින් මේ සංගීත ධාරාවේ රොනී ලීච් නියෝජනය කළ තැන සුවිශේෂී එකක්. ශරීරයෙන් පොඩි වුණත් සැබෑ එන්ටටේනර්ස්ලගෙ පරම්පරාවෙ රොනී ලීච් යෝධයෙක්. දාහක් ප්‍රශ්න වලින් හෙම්බත්වෙච්ච මිනිස්සුන්ගෙ මුවේ සිනාවක් රැන්දූ සුන්දර මිනිසා ගැන මතකය සදාකාලික වේවි කියලා චූටි මල්ලිට හිතෙනවා.

## කලාවේ වෙළඳාම

කලාවයි වෙළදාමයි අහසයි පොළොවයි වගේ කවදාවත් එකතුවෙන්නෙ නෑ කියල තමයි බොහොමයක් අය හිතන්නෙ. ඒත් චූටි මල්ලිට හිතෙන්නෙ මේ දෙක ගලවන්න බැරි විදිහට පෑහිලා තියෙනවා කියලයි. එක එක ඔස්තාද්ලා මොන මොන බයිලා ගැහුවත් බහුතරයක් කලාවෙ නියැලෙන්නෙ ඒකෙන් ජීවිතේ ගොඩගන්න මිසක් කලාව ගොඩගන්න නොවන බව අපි හැමෝම දන්නවනෙ. ඒ වෙනුවෙන් මිනිස්සු තමන්ගෙ නිර්මාණවලට මොන දෙයක් කරල හරි ගතම් එක හොයාගන්න පසුබට වෙන්නෙ නැහැ රටේ ඉන්න පාඨකයොයි ප්‍රේක්ෂකයොයි ඒක තේරුම් අරගෙන ගනුදෙනු කරනවනම් අවුලක් වෙන්නෙත් නැහැ. ජාතිආලකාරයන්ටයි ආගම් මුරකාරයන්ටයි විගඩම් නටන්න ඉඩක් ලැබෙන්නෙත් නැහැ. කොහෙද ඉතින් අපේ රටේ එහෙම තත්ත්වයක්. වචන කියන ඒවා තියෙන්නෙ හරඹ කරන්න තමයි. ඒ කරන හරඹෙ කරන්නෙ කොහොමද කොතැනද මොන අරමුණකින්ද කියන එකයි වැදගත්. දැන් වෙලා තියෙන්නේ "වැදගත්" කියන එකට වටිනාකමක් නැතිවීමයි. ඒක නිසාම ගනුදෙනුවකදි අන්තර්ගතයට වඩා මතුපිට ක්ෂණික ආකර්ශනය ප්‍රමුඛ වෙනවා. ඒ ආකර්ශනය වෙනුවෙන් මිනිස්සු ගෙවන මිලට වටිනාකමක් නැති බව තේරුම්ගන්නෙ පමාවෙලා. ඒ පමාව තමයි නිර්මාපකයා ලබන ලාබය. කලාවෙයි වෙළඳාමෙයි වර්තමාන තත්ත්වය සරළව ඕක තමයි. කියන්නේ මොකක්ද කරන්නේ මොනවද කියල ටක් ගාලා තේරුම්ගන්න මිනිසුන් හදන්න සිස්ටම් චේන්ජ් එකකින් මිසක් වෙන ක්‍රමයකින් බැහැ. ඒ වෙනස වෙනකං මිනිස්සු වචන වල තේරුම් වලටත් පැටලිලා ඇඹරිලා කාකොටාගෙන ඉඳීවි.

බුදුන්ගෙ රස්තියාදුවටත් තරුවන් සරණටත් උනෙත් ඕක තමයි. සිස්ටම් එක වෙනස් කරන්න උත්සාහ නොකර තහනම් කරලා නීති දාලා දඬුවම් කරලා මේවා පාලනය කරන්න හදන මිනිස්සු ගැන අපට දුකයි. සදාචාර විරෝධී බවට වගේම ලිවීමේ අයිතියට එරෙහිව එන වාරණයටත් අපි විරුද්ධයි. පුලූවන් නම් මේ නිර්මාණවලටත් ක්‍රමයක් හදන්න මුකුත්ම බැරිනම් අර චිත්‍රපට වගේ G, PG, M, MA, R, X වගේ වර්ගීකරණයක්වත් කරලා බලන්න. මිනිස්සුන්ගෙ අයිතියට චණ්ඩිකම් නොදා.

## වතුර වගේ

අපි පුංචි කාලෙ ලේසියෙන්ම කෙරෙන දේකට කිව්වෙ "වතුර වගේ" කියලා. ඒ තරම් වතුර අපි ළඟ තිබුණා. ඒත් ඉතින් කාලය මැව් වෙනසක අරුමේ කියලා අන්තිමේ වතුරත් බෝතල් වලින් කඩෙන් අරගෙන බොන තැනට වැටුණා කිව්වම නිකං පුදුමයි පුදුමයි වගේ.

ඉස්සර පණ යන්න සෙල්ලම් කරලා වතුර තිබහ වුණාම අහළ පහළ ගේක ලිඳකින් වතුර බොන එක අපේ සිරිතක්. "නැන්දේ ලිඳෙන් වතුර බොන්නදෝ" කියලා අහන පරක්කුව විතරයි. පනිට්ටුවෙන් වතුර ඇදලා බඩවල් පිරෙනකල් බොන්න ලැබෙනවා. පිරිසිදු රසවත් සීතල වතුර. ඒ යුගය ඉවරයි වගේ දැන්.

නගරබද පර්චස් හයේ ඉඩම් වල දැන් ලිං කපන්න ඉඩක් නැහැ. කැපුවත් අධික ජනගහනය නිසා ලැබෙන්නෙ දූෂණය වෙච්ච වතුර. ඒ නිසා පයිප්පෙන් එන වතුර තමයි පිහිටට තියෙන්නෙ. පාරට බැස්සොත් කඩේකින් වතුර බෝතලයක් සල්ලි වලට ගන්න වෙනවා.

මේ බෝතල් වතුර කෙරුවාවෙ හොඳම පැත්ත තමයි කිවුල් වතුර තියෙන පැති වලදි පිපාසෙ නිවාගන්න පුපුවන් හොඳ වතුර ටිකක් බෝතලයකින් බොන්න ලැබෙන එක. ඒත් ඉතින් වතුරත් සල්ලි වලට ගන්න වෙන තරමට පරිසරය දූෂණය වුණා කියන එක නම් ලේසියෙන් හිත් වලින් බැහැර කරන්න බැරි කාරණාවක්. අපේ ලෝකය මේ යන ක්‍රමයෙදි කොතනින් නවතියිද කියලා චූටි මල්ලිට හිතාගන්නවත් බැහැ. අන්තිමේදී අපේ දරුවන්ට පිරිසිදු වාතය වෙනුවෙන් ඔක්සිජන් බෝතලත් පිටේ බැඳන් යන කාලයක් එයිද කියලා චූටි මල්ලිට සැකයි.

## ආදිශිෂ්‍ය මේනියාව

චූටි මල්ලි ඉගෙනගත්තෙ නුවර නම ගිය ඉස්කෝලෙක. මාත් මගේ ඉස්කෝලෙට මැරෙන්ඩ තරම් ආදරෙයි. ඒත් කවදාවත් චූටි මල්ලි සමාජයේ කැපීපේන්න ඉස්කෝලෙ නම පාවිච්චි කළේම නැහැ. චූටි මල්ලි කවදාවත් පුංචි ඉස්කෝල වලට ගිය මිනිස්සු ඉස්සරහ ලොකු කම පෙන්නන්න තමුංගෙ ඉස්කෝලෙ නම පාවිච්ච කළේ නෑ. කරන්නෙත් නෑ. වෙන එකක් තියා මෙහෙ තියෙන හැට හුටහමාරක් වෙච්ච ආදිශිෂ්‍ය සංගම් හරඹෙටවත් චූටි මල්ලි සම්මාදං වුණේ නැහැ.

අපි හැමෝම අපි ගිය ඉස්කෝල වලට ආදරයි. කොළඹ රෝයල් එකට ගිය මිනිහගෙ ඉඳන් කහටගස්දිගිලියෙ නැත්නම් මහවිලච්චියෙ කණිෂ්ට විද්‍යාලයට ගිය එකා දක්වා හැමෝම තමන්ගෙ ඉස්කෝලෙට ආදරෙයි. හැමෝම තමුන්ගෙ ඉස්කෝල වලට ගෞරව කරනවා. ඒත් මේ කොළඹ සමහර ඉස්කෝල වලට ගිය මිනිස්සුන්ගෙ ආදි ශිෂ්‍ය කන්කරච්චලේ නම් ඕනෑවටා වඩා වැඩියි කියලා චූටි මල්ලිට පේනවා. චූටි මල්ලිට විතරක් නෙවෙයි. කතා කරපු හැමෝම කිව්වෙ මේ මිනිස්සු තමුන්නෙ ඉස්කෝලෙ නම විකුණගෙන පොරවල් වෙන්න උත්සාහ කරනවා කියලයි. චූටි මල්ලි නම් දකින්නේ මේක මේනියාවක් කියලයි. තමුන්ගෙ හීනමානය වහගන්න කරන සෙල්ලමක් කියලයි.

ගමේ ගොඩේ සාමාන්‍ය මිනිස්සු ඉස්සරහ " මං අහවල් ලොකුම ලොකු ඉස්කෝලෙට ගිය ලොකු පොරක්" කියලා කැපී පේන්න දඟලන එක මේනියාවක් නොවෙයි නම් වෙන මොකක්ද? ඔන්න කියන්න තියෙන දේ මෝල්ග හෙන් ගැහුවා වගේ කෙළින්ම කිව්වා. දැන් ඉතින් ඒ මේනියාව තියෙන අයට පුලුවං කඩු පොලු අමෝරාගෙන ඇවිත් චූටි මල්ලිව සුන්නද්දූලි කරලා දාන්න.

## වැඩිහිටියන්ගෙ දිනේ

ලෝක වැඩිහිටියන්ගෙ දිනේ යෙදෙන්නෙ මේ ඔක්තෝබර් මාසෙය කියන එක ඕන්න අහම්බෙන් වගේ චූටි මල්ලිට මතක් වුණා. ඉතින් තමුන් අතින් වැඩිහිටියන්ට වෙන්න ඕනෙ යුතුකම් හරියාකාරව ඉටුවෙනවාද කියන කාරණේ මේ දවසෙදිවත් කල්පනා කරලා බලන එක හොඳයි නේද? මොනවා හරි අතපහු වුණ යුතුකමක් තිබුණොත් වහාම ඒව ඉටුකරලා දාලා සැනසිල්ලේ ඉන්න එක කොයි තරම් හොඳයිද?

අද තරුණ අපි හෙට වැඩිහිටියන් වෙන දවසක අපේ දරුවන් අතින් අපට ඉටුවෙන්න තියෙන යුතුකමක් ඉටු නොවුණොත් අපට කොයි තරම් දුකක් ඇතිවෙයිද කියලා හිතමුකෝ පොඩ්ඩකට. එහෙම හිතලා හරි අපේ වැඩිහිටියන් වෙනුවෙන් මොහොතක් වෙන් කරන්න උත්සාහ කරමු.

